# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2024**
**2026 ජූලි / අගෝස්තු**

**සමාජීය විද්‍යා පීඨය**

## දර්ශනය

**දර්ශනය හැඳින්වීම - PHIL 18214**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. ''දර්ශනය යනු හුදෙක් දැනුම රැස්කිරීමක් නොව, ප්‍රශ්න නැගීමේ හා විවේචනාත්මකව විමසීමේ ක්‍රියාවලියකි.'' පැහැදිලි කරන්න.

02. 'සත්‍ය' පිළිබඳ විවිධ වාදයන් හඳුන්වා දෙමින් එමගින් දාර්ශනික ගැටලු විසඳීමට ලැබෙන දායකත්වය අගයන්න.

03. **එක්කෝ**

    බුද්ධිවාදය හා අනුභූතිවාදය අතර දාර්ශනික ගම්‍යතාවන් වෙන් වෙන් වශයෙන් පෙන්වා දෙන්න.

    **නැත්නම්**

    'මධ්‍යකාලීන දර්ශනයේ ප්‍රධාන අරමුණ වූයේ ආගමික ඇදහිල්ල හා තාර්කික බුද්ධිය අතර සමගියක් ඇතිකිරීමයි' සාකච්ඡා කරන්න.

04. 'දෙවියන් වහන්සේ' පිළිබඳව කරන ප්‍රකාශනයක් සත්‍ය හෝ අසත්‍ය බව විද්‍යාත්මකව ඔප්පු කළ නොහැකි බැවින් ඒවා අර්ථ විරහිත බව පැවසීම යුක්ති යුක්ත වේද? විශ්ලේෂණයක යෙදෙන්න.

05. අප ලෝකය දකින්නේ එය පවතින අයුරින්ම ද? ප්‍රත්‍යක්ෂයේ සීමා ඇසුරෙන් විමසීමක් කරන්න.

06. 'දැනම යනු සාධාරණීකරණය කළ සත්‍ය විශ්වාසයයි.' ඒ.ජේ. ඒයර්ගේ දාර්ශනික මතය සමඟ විග්‍රහාත්මක විශ්ලේෂණයක යෙදෙන්න.

07. 'මිනිසාට තීරණ ගැනීමේ පූර්ණ නිදහස ඇතිබව ස්වච්ඡන්දතාවාදීන් දක්වයි. විමර්ශනයක යෙදෙන්න.

08. මරණ දඬුවම සදාචාරාත්මකව සාධාරණීකරණය කළ හැකිද? පක්ෂ සහ විපක්ෂ කරුණු විවේචනාත්මකව අගයන්න.

*****************************